**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

# රජයේ නිලධරයන්ට අදාළව පැවැත්වෙන විධිමත් විනය පරීක්ෂණවලදී විනය පරීක්ෂණ නිලධරයන් ලෙස කටයුතු කිරීම සඳහා නීතිඥයින් ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උපවගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව නීතිඥයන්ගෙන් සමන්විත විනය පරීක්ෂණ නිලධාරී සංචිතය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :-**

01. නීතිඥවරයකු වශයෙන් දස වසරකට වඩා පළපුරුද්ද සහ වයස අවුරුදු 65 නොඉක්මවා තිබීම.
02. නීතිඥවරයා යහපත් වෘත්තීය තත්ත්වයක් දරන බවට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කරනු ලබන සහතිකය (Letter of Good Standing) (අයදුම්පත්‍රය සමඟ ඇමුණුමක් වශයෙන් ඉදිරිපත් කළ යුතුය).

**සැ. යු :-**

(I) සංචිතයට තෝරා ගැනීම අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන කමිටුව විසින් සිදු කරනු ලබන අතර ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:11, 19:12 හා 19:13 උපවගන්තිවල සඳහන් විධිවිධාන වලට අනුව ඉවත් කිරීම සිදු කරනු ලබයි.

(II) ඉහත අංක 02 හි සඳහන් සහතිකය වසර 05කට වරක් ආවරණ ලිපිය (ඇමුණුම 02) සමඟ ඉදිරිපත් කළ යුතු අතර එලෙස සිදු නොකරනු ලබන නීතිඥවරුන් එය ඉදිරිපත් කරන තුරු සංචිතයෙන් ඉවත් කිරීම සිදු කරනු ලබයි.

විනය පරීක්ෂණ නිලධරයන් වශයෙන් ලියාපදිංචි වීමට කැමැත්ත දක්වන ඉහත සුදුසුකම් ඇති නීතිඥයන් විසින් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙහි වෙබ් අඩවිය වන www.pubad.gov.lk වෙතින් ලබා ගත් ආකෘති පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

**ආයතන අධ්‍යක්ෂ ජනරාල්**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**
**නිදහස් චතුරස්‍රය**
**කොළඹ -07**

අයදුම්පත්‍ර පරීක්ෂාවෙන් පසු තෝරා ගනු ලබන නීතිඥයන් විනය පරීක්ෂණ නිලධරයන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරන අතර විනය පරීක්ෂණ සඳහා කරනු ලබන ගෙවීම් 2025.10.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 27/2025 මඟින් තීරණය කරනු ඇත.

**එස්.ආලෝකබණ්ඩාර**
**ලේකම්**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**
**2026.02.20**

**නිදහස් චතුරස්‍රය**
**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**
**කොළඹ -07**

ඇමුණුම 01

## නීතිඥ විනය පරීක්ෂණ නිලධාරී සංචිතයට බැඳීම සඳහා අයදුම්පත්‍රය

1. මුලකුරු සමග නම:...........................................................................................................
2. මුලකුරු වලින් හැඳින්වෙන නම:.........................................................................................
3. පෞද්ගලික ලිපිනය:.........................................................................................................
4. පදිංචි දිස්ත්‍රික්කය:...........................................................................................................
5. පදිංචි ග්‍රාම නිලධාරී වසම:................................................................................................
6. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය:.........................................................................................
7. පෞද්ගලික දුරකථන අංකය : නිවස- ................................ ජංගම:......................................
   විද්‍යුත් තැපැල් ලිපිනය:.........................................................
8. උපන්දිනය:.........................................................................................................................
9. ජාතික හැඳුනුම්පත් අංකය :...............................................................................................
   (ඡායා පිටපතක් අමුණා එවන්න)
10. නීතිඥවරයකු ලෙස දිව්රුම් දුන් වර්ෂය:..............................................................................
11. ලියාපදිංචි අංකය:...........................................................................................................
12. විනය පරීක්ෂණ පැවැත්විය හැකි මාධ්‍ය:සිංහල/දෙමළ/ඉංග්‍රීසි:.............................................
13. විනය පරීක්ෂණ පැවැත්විය හැකි දිස්ත්‍රික්ක/දිස්ත්‍රික්කය:........................................................
14. ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කරනු ලබන සහතිකය අමුණා ඇත.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමි.

මා විනය පරීක්ෂණ නිලධාරියකු වශයෙන් තෝරාගනු ලැබුවහොත් 1999 නොවැම්බර් 01 දින සිට බලාත්මක වන ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ ඇති කොන්දේසි ප්‍රකාර හා රජය විසින් වරින්වර පනවන කොන්දේසි අනුව කටයුතු කරන බවට හා විනය පරීකෂණ අවසන් වී නොපමාව මගේ වාර්තාව විනය පරීක්ෂණයට අදාළ සියලු ලිපි ලේඛන සමග අදාළ විනය බලධාරියා වෙත භාරදෙන බවට පොරොන්දු වෙමි.

..........................................

අයදුම්කරුගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය:-...................................

**ඇමුණුම 02**

..........................................

..........................................

..........................................

..........................................

..........................................

..........................................

දිනය-:.................................

ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ -07

**<u>නීතිඥ විනය පරීක්ෂණ නිලධාරී සංචිතයෙහි සාමාජිකත්වය යාවත්කාලීන කිරීම</u>**

...............................................................වන මා විනය පරීක්ෂණ නිලධාරියකු වශයෙන් .......................................... දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ......................................හි අනු අංක ................................යටතේ ලියාපදිංචි වී සිටින අතර යහපත් වෘත්තීය තත්ත්වයක් දරන බවට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කරනු ලබන සහතිකය මේ සමඟ ඉදිරිපත් කරමි.

.....................................................

අත්සන හා නිල මුද්‍රාව